ශීර්ෂය 274 අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
-------------------------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 27 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම.**

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/3 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| නිරීක්ෂණය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙනත් ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරන ලද රු.416,189,549 ක් වූ වටිනාකම වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් වශයෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට වෙනත් ගණන් දීමේ නිලධාරින් වෙනුවෙන් එකතු කරන ලද ආදායම් ඇතුළත් නොකළහොත් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ගැලපීමක් කළ නොහැකි වේ. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරන ලද ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් නොකළ යුතුයි. |

**1.6.2 ගිණුම් ඉදිරිපත් කිරීම.**

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

| නිරීක්ෂණය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 ඔක්තෝබර් 26 දිනැති අංක 2021/02 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03.9 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අඩංගු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි එකතුව වූ රු.4,086,325,892 කට අදාල වත්කම් පිළිබඳ දෙපාර්තමේන්තු පොත්වල එක් එක් වත්කම් ශේෂ ලැයිස්තුවක් හෝ වත්කම් හඳුනාගත හැකි වත්කම් ලේඛනයක් විගණයට ඉදිරිපත් නොවීය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මූල්‍ය නොවන වත්කම් වලට අදාළ ශේෂ ලැයිස්තුවක් සකස් කර ඇත. | සිගාස් වැඩසටහන පරිදි එක් එක් වත්කම් වෙන වෙනම හඳුනාගත හැකි පරිදි වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතුය. |

**(ආ) නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| නිරීක්ෂණය | | | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (i) | 2009 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධිත) පනතේ 9(අ)(1) සහ (2) වගන්ති | - | ජාතික රක්ෂිත භූමියකට මායිමේ සිට සැතපුම් 01 ක් ඇතුළත කරනු ලබන සියලු සංවර්ධන කටයුතු සඳහා වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගතයුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව විල්පත්තු අභයභූමි මායිමේ සැතපුමක් ඇතුළත (පේරක කලාපය තුළ) පිහිටි ඉඩම්වල පෞද්ගලික සමාගමක් විසින් කෝමාරිකා වගා ව්‍යාපෘතියක් සහ ඊට අදාළ වෙනත් සංවර්ධන කටයුතු සිදු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික පාරිසරික පරීක්ෂණයක් මගින් පරිසර ඇගයීම් තක්සේරුවක්ද සිදු කර නොතිබුණි. | කෝමාරිකා වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සමාගමට කිසිදු අවසරයක් ලබාදී නොමැත. පේරක කලාපය තුළ වගා කටයුතු සිදු වන්නේ සමාගම හා ඉඩම් හිමියන් අතර එකඟතාවයෙනි . | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | ඉඩම් කොමසාරිස් ජනරාලේගේ අංක 2008/04 හා 2008 අගෝස්තු 20 දිනැති චක්‍රලේඛය | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 ක අනාවරණය වී තිබූ විවිධ රක්ෂිත හා රජයේ ඉඩම්වල අනවසර අල්ලා ගැනීම් පාලනය සඳහා චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි. | අධිකරණය මගින් නඩු පැවරීම් ඇතුළු ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් පවතී. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (v) | ජනාධිපති ලේකම්ගේ SP/PCMD/06/2015 හා 2015 ජූනි 16 දිනැති රාජ්‍ය ආයතන විසින් අනුගමනය කළයුතු බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද මැයෙන් වූ චක්‍රලේඛය | 4,198,198 | රාජ්‍ය ආයතනවල වායුසමීකරණ යන්ත්‍ර සවි කිරීමේදී බලශක්ති සංරක්ෂණයට දායක වන Inverter සහිත වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගෙන සවි කළයුතු වුවද, අවස්ථා 3 කදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 කට සවි කිරිම සඳහා මිලදී ගෙන තිබූ වායු සමීකරණ යන්ත්‍ර 27 ක් Inverter රහිත වායු සමීකරණ යන්ත්‍ර විය. | Inverter සහිත වායු සමීකරණ යන්ත්‍ර වෙළඳපොලේ මිල අධික බැවින් හා වෙළඳ පොලේ හිඟ බැවින් Inverter රහිත වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගත් බව දන්වමි. | බලශක්ති සංරක්ෂණයට දායක වන Inverter සහිත වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් වී නොතිබුණු වැය විෂයයන් 02 ක් සඳහා රු.275,000,000 ක මුදලක් පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගෙන තිබුණු අතර, එම මුදලින් සියයට **81** කට වඩා වැඩි ප්‍රමාණයක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | වී මිලදී ගැනීමට සහ කාබනික පොහොර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මෙම ප්‍රතිපාදන පසුව භාණ්ඩාගාරය විසින් ලබා දුන් අතර ප්‍රමාණවත් වී තොග නොමැතිවීම හා කාබනික පොහොර සැකසීමට ගොවීන් උනන්දු නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් පරිදි සිදු නොවීය. | ප්‍රතිපාදන ලබාගැනීමේදි ක්‍රියාත්මක කළහැකි ව්‍යාපෘති පිළිබඳව මනා අධ්‍යනයක් කර ප්‍රතිපාදන වෙන් කර ගත යුතුය. |
| **(ආ)** | වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු.519,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.322,991,490 ක් ඉතිරි කර තිබුණි. එය එක් එක් වැය විෂයයන්හි ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 සිට සියයට 97 ක් දක්වා පරාසයක විය. | කොවිඩ් තත්ත්ව හේතුවෙන් අදාළ කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම හා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන නොලැබීම. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන්ම නිවැරදිව පිළියෙල කිරීමට වගබලා ගතයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය භාරයන් ඉටු නොකිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පදිංචි සහ ගොවිතැන් කටයුතු වල නියැලී ඉඩම් නොමැති අය සඳහා ඉඩම් ලබාදීමට හා දැනට ඉඩම් හිමි එහෙත් නීත්‍යානුකූල අයිතිය නොමැති අය සඳහා විධිමත් බලපත්‍ර ලබාදීම සඳහාත් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කළමනාකරණය විධිමත් කිරීම සඳහා වූ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමට කටයුතු කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 හි ග්‍රාම නිලධාරී වසම් 632 ක ඉඩම් කච්චේරි 128 ක් පමණක් පවත්වා තිබුණි. | කොවිඩ් තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි වූ ඉඩම් කච්චේරි ඉදිරිදෙී පැවැත්වීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දීර්ඝකාලීන (වාණිජ) බලපත්‍ර හිමි බදුකරුවන් තිදෙනෙකුගේ බදු බලපත්‍ර කාලය අවසන් වී වසර 2 ක් ඉක්මවා ගොස් තිබුණද, නව තක්සේරුව අනුව බදුකරය දීර්ඝ නොකිරීම හේතුවෙන් එම ඉඩම්වලින් බදු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියට යවා ඇති අතර, අනුමැතිය ලද විගස බදු අයකර ගැනීමට කටයුතු කරමි. | බදු කාලය අවසන් වූ පසු බදුකරය අලුත් කර නව තක්සේරුව ප්‍රකාර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ප්‍රධාන කාර්යයට පටහැනි ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාජාංගනය යාය 18 අංක 456 දරන ග්‍රාම නිලධාරී වසමේ ගොවීන්ට ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ නේවාසික කටයුතුවලට හා ගොවිතැන් කටයුතුවලට බලපත්‍ර ලබාදී ඇති ඉඩම් ව්‍යාපාරික අරමුණින් කෝමාරිකා වගා ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික සමාගමකට ලබාදී තිබූ අතර, එම ව්‍යාපෘතිය තුළින් ගොවීන්ගේ ඉඩම් අයිතිය අදාළ සමාගම විසින් අත්පත් කර ගැනීමේ අවදානමකට ලක් වී තිබුණි. | ප්‍රදේශවාසීන් හා අදාළ සමාගම අතර අන්‍යෝන්‍ය අවබෝධයෙන් කොමාරිකා වගා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. | ඉඩම් සංවර්ධන පනත ප්‍රකාරව නේවාසික හා වගා කටයුතු සඳහා ලබාදී ඇති ඉඩම් වාණිජ කටයුතු සඳහා යොදා ගන්නේ නම් අදාළ ඉඩම්වල සන්තකය ආපසු ලබාගෙන දීර්ඝකාලීන බදු පදනම මත ලබාදිය යුතුය. |

### 3.3 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම.

| විගණන නිරීක්ෂණ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.196,909,215 ක ප්‍රතිපාදනවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 34 ක් අනුමත ව්‍යාපෘති වාර්තාවේ සඳහන් කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් නොකිරීම හේතුවෙන් රු.94,455,778 ක වැඩ කොටස් පමණක් ඉටු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රු.33,605,796 ක වටිනාකම ඇති කාර්යයන් ඉටු කරගත නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති සඳහා අවශ්‍ය භාණ්ඩ හා අනෙකුත් දෑ සපයා ගැනීමට වෙළඳපොල තුළ භාණ්ඩ හිඟවීම හා කොරොනා තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | අනුමත ව්‍යාපෘති වාර්තාවේ සඳහන් කාලසීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රතිපාදන උපයෝජනයට කටයුතු කළ යුතුය. |

### 3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබානොගැනීම.

| විගණන නිරීක්ෂණ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 මාර්තු 21 දිනැති අංක 1/2018 දරන ග්‍රාම ශක්ති ජනතා සමාගම් පිහිටුවීම මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර තිබූ ග්‍රාම ශක්ති ජනතා සමාගම් වල චක්‍රීය ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සමාගම්වල බැංකු ගිණුම් වෙත ලබාදී ඇතත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක පිහිටුවා තිබූ ග්‍රාම ශක්ති ජනතා සමාගම් 113 ක් අක්‍රීය තත්තවයේ පැවතුණි. එම සමාගම් බැංකු ගිණුම්වල රු.32,418,605 ක මුදල් ශේෂයක් ප්‍රයෝජනයට නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවතුණි. | 2019 රජය වෙනස් වීමත් සමඟ ග්‍රාම ශක්ති ව්‍යාපාරය අඩපණ වීමෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බාධා මතුවීම හා ග්‍රාම ශක්ති සමාගම් සාමාජිකයන්ගේ උනන්දුව අඩුවීම හේතුවිය. | ප්‍රතිලාභීන්ට උපරිම ප්‍රයෝජන ලැබෙන සේ චක්‍රීය අරමුදල් උපරිමයෙන් භාවිත කිරීමට හැකි වනසේ ණය වැඩසටහන් යලි සමාලෝචනය කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අලිමිනිස් ගැටුම අවම කිරීම සඳහා විදුලි වැට නඩත්තුව හා පසු විපරම් ක්‍රියාවලියට අදාළව විදුලි වැට ආශ්‍රිත මුර කුටි 60 ක් ඉදිකිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් රු.56,079,458 ක ප්‍රතිපාදනයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙහි ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදු වූ අඩුපාඩු පහත වේ. | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 ඡේදය ප්‍රකාරව සහ ලංසු ලේඛනවල ඇති නිර්ණායක මත ප්‍රසම්පාදනයට අදාළ ලංසු ඇගයීමේදී කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස ඉටු කිරීමට ඇති මූල්‍ය හා තාක්ෂණික හැකියාව හා පෙර පළපුරුද්ද සලකා බැලිය යුතුය. එසේ සිදු නොකිරීම හේතුවෙන් වඩාත් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට අපොහොසත් වීමෙන් අපේක්ෂිත මුරකුටි 60 න් 15 ක් පමණක් ඉදිකිරීම් කර කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි. | සී 4 ශ්‍රේණිගත කිරීම් මත කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වී ඇති බැවින් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට හැකියාව ඇති බැව් නිගමනය කර කොන්ත්‍රාත්තුව පවරා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කිරීමට පෙර සිදු කළයුතු ඉඩම් අත්පත් කර ගැනීම් ඇතුළු උපයෝගි සේවා ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉටු කර ගෙන නොතිබීම හේතුවෙන් මුර කුටි 60 න් මුර කුටි 29 ක වැඩ ආරම්භ කිරීමට නොහැකිව අතහැර දමා තිබුණි. | වනජීවී දෙපාර්තමේන්තුව මගින් සකස් කර එවා තිබූ ඇස්තමේන්තුව මගින් කොන්ත්‍රාත්තුව පිරිනැමීම කළ අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය පමණක් මෙම ආයතනය විසින් සිදු කර ඇත. | - එම - |
| (iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 ප්‍රකාරව ප්‍රසම්පාදනයට අදාළ කාලසටහනක් හා වැඩ සැලැස්මක් ලංසුකරුගෙන් ලබාගෙන අනුමත කර ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මගින් වර්ෂ අවසානයේ ප්‍රතිපාදන ලබාදෙන බැවින් කාල සටහනක් සකස් කිරීමට නොහැකි වූ අතර, මින් ඉදිරියට ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගනිමි. | - එම - |

| | | |
|---|---|---|
| (ආ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ නාමපුවරු 600 ක් සාදා සවිකිරීම සඳහා රු.1,177,200 ක් ගෙවා තිබූ අතර, ඒ සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සුදුසුකම් ලත් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුට අදාළ ටෙන්ඩරය පිරිනැමීමට කටයුතු නොකර ඔහුගේ කැමැත්තකින් තොරව එම මිල ගණන් වලට වඩා ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුට අවම ලංසුකරුගේ මිල ගණන් යටතේ ටෙන්ඩරය පිරිනමා තිබුණි. මෙම තීරණය තුලින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) ඡේදය ප්‍රකාරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සමාන හා උපරිම අවස්ථා ලබාදිය යුතු බවට වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ මූලික මූලධර්මය උල්ලංඝනය වී තිබුණි. | අවම ලංසු ඉදිරිපත් කළ ආයතනයට මෙම සැපයුම් භාර දී ඉටු කිරීමට ප්‍රමාද වුවහොත් වෙනත් ආයතනයක් මගින් ඉටු කරවා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් මෙම තීරණය ගන්නා ලදී. | - එම - |
| (ඇ) සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ පවුල් ලක්ෂ 2 ක් සවිබල ගැන්වීම් සඳහා වර්ග 3 කට අයත් වතුර මෝටර් 630 ක් මිලදී ගැනීම සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සුදුසුකම් ලත් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරු ලංසු ලේඛන මගින් ඉල්ලා තිබූ ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර තිබියදී එය පිළිනොගෙන එම ලංසුකරු ප්‍රතික්ෂේප කර වැඩි මිල ගණන්වලට ටෙන්ඩරය පිරිනැමීම හේතුවෙන් රු.5,608,700 ක අලාභයක් සිදු වී තිබුණි. | අදාළ ආයතනය ඉල්ලා ඇති ලේඛන ඉදිරිපත් කර නොතිබීම මත ඔහුගේ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කරන ලදී. | රජයට උපරිම වාසි සැලසෙන සේ ප්‍රසම්පාදන කටයුතු වලදී තීරණ ගතයුතුය. |

**3.6 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සෞභාග්‍යා නිෂ්පාදන 'ගම්මාන වැඩසටහන යටතේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද ''නිදැලි කුකුල්'' පාලන ව්‍යාපෘතිය සඳහා සකස් කර දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කරන ලද ව්‍යාපෘති වාර්තාව තුළ ව්‍යාපෘතියට අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍යවල ප්‍රමිතිය සහ පිරිවිතර ඇතුළත් කර නොතිබීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවශ්‍ය පිරිවිතර සකස් කර අනුමත කර නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේදී ප්‍රතිලාභීන් වෙත ලබාදෙන ලද රජයේ දායක මුදල් බාහිර පාර්ශවයක් මැදිහත් වී ලබාගෙන ප්‍රමිතියෙන් අඩු ද්‍රව්‍ය මිලදී ගෙන රු.1,514,700 ක මුදලක් බැහැර කරගෙන තිබුණි. | මිලදී ගතයුතු භාණ්ඩවල ප්‍රමිතිය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරී විසින් වාචිකව උපදෙස් දී ඇති අතර, භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිසිදු නිලධාරියෙකු සම්බන්ධ වී නොමැත. | ව්‍යාපෘතිය සඳහා මිලදී ගතයුතු භාණ්ඩවල පිරිවිතර අනුමත කර අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන පාර්ශව වෙත ලබාදිය යුතු අතර, එසේ නොකිරීම හේතුවෙන් රජයට සිදු වූ පාඩුව විධිමත් පරීක්ෂණයක් සිදු කර අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ)1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥා පනතේ 8(2) වගන්තිය ප්‍රකාරව ඉඩම් විෂය භාර ඇමතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව සැකසුණු 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ප්‍රාදේශීය ලේකම්වරු යටතේ පාලනය වන රජයේ ඉඩම් වල ඛණිජ ද්‍රව්‍ය එකතු කිරීම් හා ලබාගැනීම් වෙනුවෙන් ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රමාණයට රජයේ ගාස්තු අයකළ යුතුය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ විගණනයට ලක් කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක පවත්වාගෙන යන කළුගල් වැඩබිම්වලින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර තිබූ කලුගල් කැණීම් බලපත්‍රවල සඳහන් ගල් කියුබ් ප්‍රමාණය අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රජයේ ගාස්තු ආදායම රු.93,351,257 ක් අයකරගෙන නොතිබුණි. එසේම පෙර වර්ෂයන්ට අදාළ මෙම විෂයයට අයත් රජයේ හිඟ ගාස්තු රු.මිලියන 395 ක්ද අයකර ගතයුතුව තිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ එල්/2/1/79 කළුගල් හා 2021 අගොස්තු 19 දිනැති ලිපියේ උපදෙස් පරිදි සහන කාලයකට යටත්ව අයකර ගැනීමට කටයුතු කරමි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විමසා ගැසට් නිවේදනයේ සඳහන් පරිදි ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක ක්‍රියාත්මක කර තිබූ කාන්තා කාර්යාංශ ණය වැඩසටහන් යටතේ නිකුත් කළ ණය වලින් වර්ෂ 2 කට වඩා වැඩි කාලයක් වාරික අය නොවන අක්‍රීය ණය එකතුව රු.4,067,489 ක් විය. ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක වැන්දඹු කාන්තා ණය වැඩසටහන් සහ පශු සම්පත් ණය වැඩසටහන් 2020 සහ 2021 වර්ෂ තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. එම ණය වැඩසටහන සඳහා ලද චක්‍රීය ණය අරමුදල් වලින් රු.4,008,456 ක් බැංකු ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි. | විගණන හා කළමනාකරණ කමිටුවේදී ගත් තීරණ අනුව ණය වැඩසටහනේ පැවති දුර්වලතා හඳුනාගෙන යළි සමාලෝචනය කර ණය වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා උපදෙස් පතා ඇත. ඒ අනුව ලැබෙන උපදෙස් පරිදි කටයුතු කරමි. | ණය වැඩසටහන්වලට අදාළව පවතින දුර්වලතා හඳුනාගෙන එය සමාලෝචනය කර යළි ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ)දීර්ඝකාලීන බදු පදනම මත ලබාදී ඇති රජයේ ඉඩම් වලින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.394,575,735 ක හිඟ බදු අයවිය යුතුව පැවතුණි. | හිඟ බදු අයකර ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් ලබාගෙන ඒ අනුව දීර්ඝකාලීන බදු බලපත්‍රයේ කොන්දේසි ප්‍රකාරව බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කෘෂි කාර්මික කටයුතු හා නේවාසික කටයුතු සඳහා ලබාදී ඇති දීමනා පත්‍ර හිමිකරුවන් විසින් විවිධ සමාගම් වෙත සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම සඳහා එම ඉඩම්වලින් | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කිරීම ආරම්භ කර ඇත. | 2020 පෙබරවාරි 06 දිනැති අංක 2020/02 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ “ඉඩම් |

| | | |
|---|---|---|
| කොටසක් බැහැර කර තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක පිහිටි සන්නිවේදන කුළුණු 102 ක් සම්බන්ධයෙන් ඉහත කී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍රවල පසු කටයුතු මැයෙන් වූ" චක්‍රලේඛය ප්‍රකාරව අදාල දීමනා පත්‍ර රජයට භාරගෙන ඉහත කී චක්‍රලේඛයේ VI කොටසෙහි උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඊ)අතිගරු ජනාධිපතිතුමා විසින් අත්සන් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක් වෙත එවා තිබූ දීමනා පත්‍ර 380 ක් ලියාපදිංචි කර අදාළ හිමිකරුවන් වෙත භාරදී නොතිබුණි. | ග්‍රාම නිලධාරී මගින් අදාළ හිමිකරුවන් වෙත භාරදීමට කටයුතු කරමින් පවතී. | ප්‍රතිලාභීන් දැනුවත් කර ලියාපදිංචි කර අදාළ ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු කළ යුතුය. |